

# "ගැහුණුට වඩා බීමට ආදරෙයි"

## ප්‍රවීණ මාධ්‍යවේදී සිරිලාල් කොඩිකාර

ප්‍රවීණ ජනමාධ්‍යවේදී සිරිලාල් කොඩිකාර මහතා නොවැ 19 දා දිවියෙන් සමුගත්තේය. මෙම සංවාදය ඔහු සමඟ මීට වසර දොළහකට පෙර රාවය පුවත්පතට කරන ලද්දකි.

පිළිසඳර - විමලනාත් වීරරත්න

**ප්‍රංචිම කාලෙ පිළිබඳ මතකය කොහොමද?**

මම උපන්නෙ තලාතුඔය කියන ගමේ. ඒ 1924 දි. පියා කොඩිකාරගේ එලියන් පීරිස් එයා හොඳ වඩුවෙක්. අම්මා මොනිටර් ගුරුවරියක් වීමට සුදුසුකම් ලැබුවා. නමුත් රස්සාව ලැබුණේ නැහැ. මවගේ පියා තොවිල් පවිල් කරපු කෙනෙක් නිසා පළාතේ වංශවත් මිනිස්සු අම්මට රස්සාව ලැබෙන එක වැළැක්වූවා. මට මහණ යෝගයකුත් තිබුණා. ඒ කාලෙ මං හිතුවා මහණ වෙලා කුලභේදයට විරුද්ධව බණ කියන්න ඕනෙ කියලා. ඒක ළමා කාලෙ සිතුවිල්ලක්. නමුත් පස්සේ මම වමේ නැඹුරුවක් ගන්නත් කුලභේදය හේතුවුණා.

**පාසල් ගියේ කොහෙද?**

කෑගල්ලෙ බෞද්ධ මිශ්‍ර පාඨශාලාවට. මොකද තාත්තගෙ රස්සාව නිසා කෑගල්ලට එන්න වුණා. තාත්තගෙ ගම කොග්ගල. රස්සාවකට ආපු ගමන් අම්මව බැඳලා තලාතුඔය බින්න බැස්සා. මම තුනේ ඉඳල හතරවැනි පන්තියට පාස් වෙච්ච ගමන් මගේ මව් මියගියා. එතැනින් මගේ පාසල් ගමන ඉවරයි. ඊට පස්සෙ තාත්තා එක්ක මමයි මල්ලියි, නංගිලා දෙන්නයි හතර අතේ ඇවිද්දා. මුලින්ම තාත්තා අපිව නැවැත්තුවෙ බේරුවල නැන්දා කෙනෙකුගෙ ගෙදර. ඒ කාලෙ තාත්තා ගල්කිස්සෙ මිනීපෙට්ටි සාප්පුවක් දැම්මා. මාව එතනට ගෙන්න ගත්තා. හැබැයි පාසැලකට නොගියාට මම මේ හැම තැනකදිම පන්සල්වලට ගිහින් අකුරු ඉගෙන ගත්තා.

**මේ දවස්වල තාත්ත එක්ක වැඩ කළාද?**

අපොයි නැහැ. තාත්තා මට කවදාවත් සාප්පුවේ වැඩ කරන්න කියලා නැහැ. මම ඒවා කරන්න ගියෙත් නැහැ. මගේ පියා හරිම සැරයි. හැමවෙලාවෙම එයා කියන දෙයක් තමයි නොගහ හදන දරුවොයි හැඳි නොගා හදන කැඳයි එක වගේ කියලා. ඒ මතය අනුව මම පොඩි වරදක් කළත් පියා ගහනවා. මම සමහර දවස්වලට විනෝදෙට මිනී පෙට්ටියක නිදියනවා. ඒකටත් තාත්තා මට ගහලා තියනවා. මං දවසක් බොරු පිස්සුවක් ගත්තා නිකං අම්මා වැහිලා වගේ. ඒ පාර පියා මට හැමදේටම ගහන එක නවතත්ලා හාමුදුරු කෙනෙකු ලව්වා මගේ හඳහන බැලෙව්වා. හාමුදුරුවො කියලා තියනවා මේ ළමයගෙ හඳහන ඉතා හොඳයි මට ළමයව දෙනවා නම් වෙදකමයි, නක්ෂත්‍රයයි උගන්වන්නම් කියලා. ඒ හාමුදුරුවො කොග්ගල පඤ්ඤාරතන හිමි. මුලින් හිටියෙ කොග්ගල දේවගිරි විහාරයෙ. හාමුදුරුවෝ ගමේ කෙනෙක් නිසා මාව දෙන්නත් තාත්තා කැමති වුනා. මාව කොග්ගල අරන් ගිහින් සංස්කෘත ඉගැන්නුවා. එහිදී මාධවාචාර්යයන් ලියූ මාධව නිධානය නමැති රෝග නිධාන හඳුනාගත හැකි පොත හොඳට ඉගෙන ගත්තා. බෙහෙත් වර්ග හදන හැටිත් ඉගෙන ගත්තා. දෙවැනි ලෝක යුද්දෙ පටන් අරන් කොග්ගල අපේ පන්සල තියන හරියත් ගුවන් තොටුපලට ගත්තට පස්සෙ අපි වැලිගම පන්සලකට ආවා.

**හාමුදුරුවො කොයි වෙලාවකවත් කිව්වෙ නැද්ද මහණ වෙන්න කියලා?**

නැහැ. මේ කාලෙ මං ගමේ සාහිත්‍ය කටයුතුවලට තමයි ඇදිලා ගියේ. හාමුදුරුවන්ගෙ සෙත්කවි, වස්කවි පබැඳීම් ඉගෙන ගෙන මමත් කවි ලියන්න පටන් ගත්තා. වැලිගම කවිමඩුවල හිටිවන කවි කියන්නත් ගියා. පන්සලට යන්න පෙර මිනීපෙට්ටි සාප්පුවෙ ඉන්න කොටත් මම බඩු ඔතාගෙන එන පත්තර කොළ පවා කියෙව්වා. ඒ විදියට මම දවසක් සමසමාජ පත්තර කොළයක් කියවන කොට තාත්තා බැන්න උන්ට පිස්සු උඹ පිස්සු හදාගන්න එපා කියලා.

නමුත් වැලිගමදි මට යාලුවෙක් හම්බ වුණා ධර්මසිරි කාරියවසම් කියලා. එයාගෙ හැම පොතකම දැකැත්තයි, මිටියයි ඇඳලා තිබුණා. ධර්මසිරිගෙන් තමයි ඉතින් මම මුලින්ම වාමාංශික දේශපාලනය ගැන ඉගෙන ගත්තෙ. ඊට පස්සෙ කොමියුනිස්ට් පක්ෂයට සම්බන්ධ වුණා. 47 දී මම ප්‍රාචීණ ප්‍රාරම්භ විභාගෙටත් පෙනී සිටියා. කොහොමටත් මේ කාලෙ මට පන්සලෙන් අයින්වෙන්න ඕනකම තිබුණා. විභාග ප්‍රතිඵල එනතුරු මගේ ගුරු හාමුදුරුවො මාව කොළඹ මාලිගාකන්දෙ චන්ද්‍රසේන පොත් සාප්පුවේ වැඩ ඉගෙන ගන්න දැම්මා. මුද්‍රණාල වැඩත් ටිකක් පුරුදු වුණා.

> පන්සලට යන්න පෙර මිනීපෙට්ටි සාප්පුවෙ ඉන්න කොටත් මම බඩු ඔතාගෙන එන පත්තර කොළ පවා කියෙව්වා. ඒ විදියට මම දවසක් සමසමාජ පත්තර කොළයක් කියවන කොට තාත්තා බැන්න උන්ට පිස්සු උඹ පිස්සු හදාගන්න එපා කියලා.

**පත්තර කලාවට හිත යොමු වෙන්නෙ කොහොමද?**

මේ කාලෙ මම ලියන කවි පත්තරවල ගියා. මුලින්ම නවලෝකය කියන සඟරාවෙ කවියක් පළවුණා. පොත් සාප්පුවේ වැඩ කරන කාලෙ දවසක් මම නොරිස් පාර දිගේ යනකොට 'සිංහල ජාතිය' පත්තර කාර්යාලය දැක්කා. ඒක කළේ පියදාස සිරිසේන මහත්මයා. පසුව ගිල්බට් පෙරේරා කියන නීතිවේදියා මේ පුවත්පත මිලට ගත්තා. එයාගෙ කාලෙ තමයි මම පත්තර කාර්යාලයට ගොඩවුණේ. මට මුලින්ම එතනදි හමුවුණේ වා.ඩේ.සී. ගෞතමදාස කියන පත්‍රකලාවේදියායි. ඔහුත් වාමාංශිකයෙක්. 1948 දී ඔවුන් ගහපු වෙසක් කලාපයට මාව සම්බන්ධ කරගත්තා. මම අකුරු ඇමිණුවා. වැඩිපුරම සෝදුපත් බැලුවා. ගෞතමදාසගෙ දකුණු අත පණ නැහැ. එයාගෙ කොපි ලිව්වෙත් මම. මම ව්‍යාකරණ හා බස හොඳට දන්න නිසා එයා මට කියල ලියවාගන්න කැමතියි. විභාග ප්‍රතිඵල එනකොට මට ආයුර්වේදය තවදුරටත් ඉගෙන ගන්න ඕනකම තිබුණෙ නැහැ. පත්තර කලාවට වැටිච්ච එක ගැන ගුරු හාමුදුරුවොත් කැමති වුණා. 54 දී විතර සිංහල ජාතිය පත්තර කන්තෝරුවෙන් ඉංග්‍රීසි පත්තරේකුයි, දිනපතා පත්තරේකුයි ගහන්න ගිහින් පාඩුවෙලා මුළු පත්තර කන්තෝරුවම වහන්න වුණා.

**ඊට පස්සෙ කොහෙද ගියේ?**

දවස පත්තරේට ගියා. ඩී.බී. ධනපාල කර්තෘ. දවසට යනකොට මං බැඳලා. අනුලා ගුරු වෘත්තියේ යෙදී සිටියා. එතනදි මගේ වාර්තාකරු කියන තනතුර සාර්ථක වුණා. මට හොඳට ප්‍රවෘත්ති ලැබෙන මාර්ග තිබුණා. විශේෂාංග ලිපි, කවි මේ කාලෙ මං දිගටම ලිව්වා. ඔන්න මං මේ දක්ෂතා එක්ක සංස්කාරක කෙනෙක් වුණා.

**මේ කාලෙත් දිගටම ඇන්දෙ ජාතික ඇඳුමද? කලිසම් ඇන්දෙම නැද්ද?**

මට පුරුදු ජාතික ඇඳුම. පසුකාලෙකදි මම සෝවියට් දේශයට තුන් වතාවක් ගියා. මුලින්ම කොමියුනිස්ට් පක්ෂයේ තරුණ සමිති සාමාජිකයෙක් හැටියට. ඊළඟට පාක්ෂිකයෙක් හැටියට. තුන්වැනුව ලේඛකයෙක් හැටියට. තුන්වැනි පාර මට රුසියන් මිත්‍රයෙක් කිව්වා, අපි මිනිස්සුන්ගෙ ජාතික ගතිගුණවලට හරියට ගරු කරනවා. නමුත් අපි ඊට වඩා ගරු කරනවා සෞඛ්‍යයට. ඊට පස්සේ ඔහු කිව්වා මේ රටේ දේශගුණය සීතයි. ඔබේ ජාතික ඇඳුම හරියන්නේ නැහැ, ටයිකෝට් අඳින්න කියලා. ඒගොල්ලොම මට කලිසම් ටයිකෝට් මහලා දුන්නා. පුරුදු නැති වුණත් මං ඒ ඇඳුම් ඇඳලා හොඳ පුරුදුකාරයෙක් වගේ ගත කළා.

**දවසෙ ජීවිතේ ගෙවුනේ කොහොමද?**

ඒක යූඑන්පී විරෝධී පත්තරයක් නිසා අපි කැමැත්තෙන් වැඩ කළේ. සිරිමාවෝට සහාය දක්වන තැනක පත්තරේ තිබුණෙ. ඔන්න 64 දි සිරිමාවෝ සමසමාජ කොමියුනිස්ට් හවුලක් ඇති කර ගත්තා. ගුණසේන සමාගම මේ වැඩේට විරුද්ධ වුනා. ඔවුන් ධනපාල මහත්තයාව තමන්ගෙ පැත්තට හරවා ගත්තා. ධනපාල මෙහෙම කවියක් ලියලා පත්තරේ දැම්මා.

අගමැති රන් කඳ
ඇමති මඬලේ පුන්සඳ
නොසිතා වමේ ගඳ

☞